# 2020/2022 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම

CONFIDENTIAL

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
**අංක 163**
**කිරුළපන පාර**
**පොල්හේන්ගොඩ**
**කොළඹ 05**

**ප්‍රසම්පාදන දැන්වීම**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**<u>2021/2022 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාගැනීම</u>**

2021/2022 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාගැනීම වෙනුවෙන් **2021.02.08** දින **ප.ව. 2.00** දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මේ සඳහා රු. 500.00 ක ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදලක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබාගන්නා රිසිට්පතක් ගිණුම් අංශයට ඉදිරිපත් කිරීමෙන් පසුව ලංසු ලියකියවිලි **2021.01.15** දින සිට **2021.02.05** දින **ප.ව. 3.00** දක්වා කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

03. ලංසු ලියකියවිලි කාර්යාල වේලාවන් තුළදී නොමිලයේ පරීක්ෂා කළ හැකිය.

04. මුද්‍රාතබනලද ලංසු ලියාපදිංචි තැපැලෙන් අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 ලිපිනයට එවීම හෝ එම ලිපිනයේම ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම **2021.02.08 දින ප.ව. 2.00** ට පෙර සිදුකළ යුතුය. ලංසු විවෘත කිරීම **2021.02.08** දින **ප.ව 2.00** ට සිදු කරනු ලැබේ.

05. මිල ගණන් බහාලන කවරයේ වම් කෙළවරේ **"කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා මිල ගණන්"** ලෙස සඳහන් කළ යුතුය.

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

දුරකතන අංක :- 011 2512332 / 2514759
ෆැක්ස් අංක :- 011 2514286

CONFIDENTIAL

උපලේඛණ අංක **02**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
**2021/2022 වර්ෂය සඳහා කුලී පදනම මත ප්‍රවාහන සේවා ලබා ගැනීම**
**සඳහා මිල ගණන් කැඳවීම**

01. මෙම කාර්යය ගිවිසුමට එළඹෙන දිනයේ සිට ලිත් වර්ෂයකට බල පැවැත්වේ. එහෙත් සේවාව අසතුටුදායක බව පෙනී ගියහොත් පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවකදී සේවාව අවසන් කිරීමට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත්තේය. එවැනි අවස්ථාවකදී සේවය අවසන් කිරීමට හේතු වූ කරුණු දැක්වීමට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් බැඳී නොමැත.

02. ප්‍රවාහනය සඳහා යොදාගනු ලබන වාහනවලට ගෙවීම් කරනුයේ කාර්ය නිමවූ පසුවය.

03. ඇණවුම ලැබීමෙන් පසු නියමිත දිනට, නියමිත වේලාවට විනාඩි 30කට පෙර නියමිත ස්ථානයට පැමිණීම අනිවාර්ය වේ.

04. දිවා රාත්‍රී යන ඕනෑම අවස්ථාවකදී වාහන කැඳවීමට හා එම අවශ්‍යතාවන්ට අනුව වාහන සැපයීමට හැකියාව තිබිය යුතුය.

05. ප්‍රවාහන පහසුකම් සැපයීමේදී අදාල කාර්යයට අදාලව අධීක්ෂණ නිලධාරියෙකු සම්බන්ධ වේ. ඒ අනුව ගමනට අදාල ධාවන සටහන් දුර ප්‍රමාණ අධීක්ෂණ නිලධාරියාගේ අත්සන සහිතව බිල්පත් / ඉන්වොයිස් ඉදිරිපත් කළ යුතුයි.

06. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී අප විසින් ඉදිරිපත් කර ඇති ආකෘතියෙහිම පමණක් මිල ගණන් ඉදිරිපත් කල යුතු අතර එසේ නොමැතිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී පහත පරිදි කොටස් 02 කින් ඉදිරිපත් කළ යුතුයි. සියළුම ගමන් සඳහා දුර ප්‍රමාණයන් සේවා සැපයුම් කරුගේ ආයතනයේ සිට නොව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සිට ආරම්භ විය යුතුයි.

- දිගු දුර ධාවනය ඇමුණුම 01
- කෙටි දුර ධාවනය ඇමුණුම 02

08. දැනටමත් මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින බවටත් එම සේවා පහසුකම් ලබා දුන් රජය පිලිගත් ආයතන තුනකට ඔබ විසින් ලබාදුන් ප්‍රවාහන පහසුකම් පිලිබඳ වාර්තාවක් අදාල ඇමුණුම් සමග ඉදිරිපත් කළ යුතුයි.

09. සේවා කටයුතු ලබාදීමේදී කිසිදු රජයේ දේපලකට හානියක් නොවිය යුතුය. එවැන්නක් සිදු වුවහොත් ඒවා යථා තත්වයට පත්කර දිය යුතුය. නියම කරන කාලය තුළම එම අළුත්වැඩියාවන් සිදුනොකළහොත්, ඒ සඳහා යන වියදම ආයතනයට ගෙවීමට ඇති මුදල් වලින් හෝ ඉදිරිපත් කරන ලද ඇප බැඳුම්කරයෙන් හෝ එම කාරණා දෙකෙන්ම අවස්ථානුකූලව අයකරගනු ඇත.

10. ටෙන්ඩරයෙන් නියම වන මිල හැර කිසිදු අමතර ගෙවීමක් සේවා සැපයුම්කරුට ගෙවනු නොලැබේ.

11. එසේම සේවා කටයුතු සඳහා යොදාගත් වාහන හා උපකරණ සම්බන්ධව සිදුවන ආපදා හා අලාභ සම්බන්ධයෙන් ද මෙම දෙපාර්තමේන්තුව කිසිදු වගකීමක් නොදරන අතර එය අදාල සැපයුම්කරු විසින් දැරිය යුතුය.

12. හදිසි අනතුරකදී, කාර්මික දෝෂයකින් හෝ වෙනත් හේතුවක් නිසා වෙන් කරදෙනු ලබන වාහනය ධාවනය කළ නොහැකි අවස්ථාවකදී ඒ බැව් දැනුම් දීමෙන් අනතුරුව දිග දුර ධාවනය සඳහා යොදාගනු ලබන වාහන සඳහා පැය 02 ක් ඇතුළතද, කෙටි දුර ධාවනය සඳහා පැය 01 ක් ඇතුළත ද වෙනත් සුදුසු වාහනයක් ලබා දිය යුතුය.

CONFIDENTIAL

13. ඒ ඒ රාජකාරි අවස්ථාවන්හිදී වෙන් කරනු ලබන වාහනය සඳහා යොදවනු ලබන අධීක්ෂණ නිලධාරියාගේ ඉල්ලීම පරිදි මාර්ග නීති රීතිවලට අනුකූලව වේග සීමා පවත්වාගත යුතුය. එසේම නිවැරදි ගමන් මාර්ගය සමග නිවැරදි ගමන්දුර සටහන් තැබිය යුතුය.

14. කුලී රථය මගින් ගමන් ගන්නා මගීන් හා ප්‍රවාහනය කරනු ලබන රජයේ උපකරණ සඳහා සම්පූර්ණ රක්ෂණ ආවරණයක් තිබිය යුතු අතර හදිසි අනතුරකදී අදාල වන්දි මුදල් ගෙවීමට අදාල වාහන කුලී කරුවන් බැඳී සිටිය යුතුය. එසේම එම හදිසි අනතුරු සම්බන්ධයෙන් අප ආයතනය වගකීමට කිසි ආකාරයකින් බැඳී නැත.

15. අදාල සපයන වාහනයෙහි රියදුරු හා/හෝ සහායක අදාල රාජකාරි සේවාවේදී විනයගරුකව හා කාර්යක්ෂමව හැසිරීම ප්‍රධාන වගකීම වේ.

16. අදාළ වාහනය සමග යොදවන රියදුරුට වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම අනිවාර්ය අතර රියදුරු මනා සෞඛ්‍ය තත්වයෙන් සිටිය යුතුය.

17. අවශ්‍ය වූ විටෙක තැන්පතු මුදලක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රඳවා තැබීමට ඔබ ආයතනය එකඟවිය යුතුය.

18. මෙම ලංසුව පිළිබඳව හෝ සේවා ලබා ගැනීම පිළිබඳව හෝ අවසන් තීරණ ගැනීමේ බලය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

19. මේ සම්බන්ධව ඇති සියලු කාරණාවන්හි අවසන් තීරණය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වරයා සතු වේ.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

පූර්වෝක්ත කොන්දෙසි වලට එකඟ වෙමු.

..........................................................
ලංසු කරුගේ අත්සන හා මුද්‍රාව

නම :- ....................................................................

තනතුර :- ....................................................................

දිනය :- ................................................................

CONFIDENTIAL

උපලේඛණ අංක 3

**<u>2021/2022 වර්ෂය සඳහා කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

**<u>මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘතිය</u>**

01. ලංසු කරුගේ නම :- ..........................................................................................................

02. ආයතනයේ නම :- ..............................................................................................................

03. ව්‍යාපාර ලියාපදිංචි අංකය :- ........................................................................ (පිටපතක් අමුණන්න)

04. ආයතනයේ ලිපිනය :-

..................................................................................................................................................

..................................................................................................................................................

05. දු.ක. අංක - ආයතනය :- .................................................. ලංසුකරු :- ........................................

06. ෆැක්ස් අංකය :- .............................................

07. ඊමේල් ලිපිනය :- ....................................................................

08. වැට් බදු සඳහා ලියාපදිංචි අංකය :- ......................................................

09. වෙනත් කරුණු :-

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................

සටහන :- උපලේඛණ අංක 02 හි කොන්දේසි වලට එකඟව ඇමුණුම් අංක 01, 02, යටතේ ඉදිරිපත්කර ඇති මිලගණන් යටතේ සේවා සැපයීමට එකඟවෙමි.

| | |
|---|---|
| ..................................... | ............................................. |
| ලංසු කරුගේ අත්සන | දිනය |
| .................................... | ආයතනයේ මුද්‍රාව :- |
| නම | |

CONFIDENTIAL

## දිගු දුර ධාවනය - රියදුරු සහිත
## (කාර් / වෑන් / බස්)

| අනු අංකය | AC / Non AC | ආසන ගණන | ආසන තත්වය | අවම කි.මී. ගණන | අවම කි.මී. ගණන සඳහා ගාස්තුව | වැඩිවන කි.මී. එකක් සඳහා මිල | රියදුරු බටා | සහයක බටා |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | AC | 4 | Adjustable | 100 | | | | |
| | Non AC | 4 | Non Adjustable | 100 | | | | |
| 02 | AC | 9 | Adjustable | 100 | | | | |
| | Non AC | 9 | Non Adjustable | 100 | | | | |
| 03 | AC | 12 | Adjustable | 100 | | | | |
| | Non AC | 12 | Non Adjustable | 100 | | | | |
| 04 | AC | 15 | Adjustable | 100 | | | | |
| | Non AC | 15 | Non Adjustable | 100 | | | | |
| 05 | AC | 28 | Adjustable | 100 | | | | |
| | Non AC | 28 | Non Adjustable | 150 | | | | |
| 06 | AC | 35 | **High Decker Bus** Adjustable | 150 | | | | |
| | Non AC | 35 | Non Adjustable | 150 | | | | |
| 07 | AC | 45 | **High Decker Bus** Adjustable | 150 | | | | |
| | Non AC | 45 | Non Adjustable | 150 | | | | |

**වෙනත් :   සේවා සැපයීමට අදාල වෙනත් කාරණා**

දිනය

අත්සන හා මුද්‍රාව

# කෙටි දුර ධාවනය - රියදුරු සහිත
# (කාර් / වෑන් / බස්)

| අනු අංකය | AC / Non AC | ආසන ගණන | ආසන තත්වය | දුර ප්‍රමාණයන් | | |
|---|---|---|---|---|---|---|
| | | | | 1 km - 30 km කි.මී. 1කට ගාස්තුව | 31 km - 60 km කි.මී. 1කට ගාස්තුව | 61 km - 99 km කි.මී. 1කට ගාස්තුව |
| 01 | AC | 4 | Adjustable | | | |
| | Non AC | 4 | Non Adjustable | | | |
| 02 | AC | 9 | Adjustable | | | |
| | Non AC | 9 | Non Adjustable | | | |
| 03 | AC | 12 | Adjustable | | | |
| | Non AC | 12 | Non Adjustable | | | |
| 04 | AC | 15 | Adjustable | | | |
| | Non AC | 15 | Non Adjustable | | | |
| 05 | AC | 28 | Adjustable | | | |
| | Non AC | 28 | Non Adjustable | | | |
| 06 | AC | 35 | **High Decker Bus** Adjustable | | | |
| | Non AC | 35 | Non Adjustable | | | |
| 07 | AC | 45 | **High Decker Bus** Adjustable | | | |
| | Non AC | 45 | Non Adjustable | | | |

**වෙනත් : සේවා සැපයීමට අදාල වෙනත් කාරණා**

දිනය                                                  අත්සන හා මුද්‍රාව